# කලාව

## ප්‍රථම භාගය

## සංකල්ප සහ සිද්ධාන්ත



උදා හෙට්ටිගේ

# කලාව

## ප්‍රථම භාගය
## (සංකල්ප හා සිද්ධාන්ත)

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ**
B. A. Hons. (in Arch), Mphil, MSLAC

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ**
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
675, පී. ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10.

ප්‍රථම මුද්‍රණය: 2009

කලාව - ප්‍රථම භාගය

© උදා හෙට්ටිගේ

ISBN 978-955-30-2405-3

පිටුවැසුම් නිමැවුම:
**උදා හෙට්ටිගේ**

අක්ෂර සංයෝජනය: -
**සදීශ්වර උදයංග**

ප්‍රකාශනය:
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ** -
675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
**චතුර මුද්‍රණාලය**
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

# පෙරවදන

කලාව අධ්‍යයනය කිරීම ප්‍රධාන කාර්යයන් කිහිපයක් ඔස්සේ සිදු කෙරේ. කලා ඉතිහාසය අධ්‍යයනය කිරීම, කලාවේ මූලධර්ම හා එහි ප්‍රායෝගික අභ්‍යාසකරණය මෙහි විවිධ වූ පැතිකඩයන් ය. කලා ඉතිහාසය හෝ ප්‍රායෝගික කලාවේ නියැළෙන හා පර්යේෂකයින් සැම දෙනාටම එක සේ වැදගත් වන මූලික සංකල්ප හා ක්‍රමවේදයන් ගණනාවක් තිබේ. මෙය රටින් රටට, පළාතින් පළාතට, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් නොවේ. එහි මූලධර්මතාවය එකකි. එසේ වුවද එක් එක් රටක සංස්කෘතීන්, කලාව හා කලා සම්ප්‍රදායයන්ගේ මෙන් ම ශෛලීන්ගේ වෙනස්කම් හඳුනාගත හැකි ය. මේ සියලුම කාර්යයන් සඳහා කලාව යනු කුමක් ද ?, එහි මූලික සංකල්ප හා න්‍යායන් මෙන් ම ශිල්ප ක්‍රම මොනවාද යන්න අධ්‍යයනය කළ යුතු ය. මේ නයින් බලන කළ ඕනෑම ශෛලියයක් ගුරු කුලයක් හෝ සම්ප්‍රදායක් ගොඩනගා ගනු ලබන්නේ ද. මූලික කලා න්‍යායක් හා සිද්ධාන්ත මත පිහිටා ය. ලෝකයේ කලාව පිළිබඳ අධ්‍යයනය හා එය හඳුනාගැනීම ද ඒ සමඟ ම කළ යුතු ය. මෙය චිත්‍ර ශිල්පියෙකුට මූර්ති ශිල්පියෙකුට හෝ කලා ඉතිහාසඥයෙකුට අත්‍යවශ්‍ය වේ. නොඑසේනම් ස්වකීය කලා පරාසය හඳුනාගනිමින් තමන්ට ආවේණික ශෛලියක් ගොඩනගා ගැනීමට හෝ ඒවා අධ්‍යයනය කරමින් ලෝකයේ කලා ඉතිහාසය හඳුනා ගැනීමට හෝ ඒ පිළිබඳ නිගමන ලබා දීමට අසීරු වේ. මේවා න්‍යායයන්, සංකල්ප හෝ ප්‍රායෝගික තත්ත්වයක් විය හැකි ය. එකී මූලික පරාසය තුළ පිහිටා මෙම කෘතිය කොටස් දෙකකින් ඉදිරිපත් කිරීමට අදහස් කළෙමි. මෙම මුල් කොටසේ කලාවේ මූලික සිද්ධාන්ත, කලාව හා එහි විෂය පථය හඳුනාගැනීම මෙන් ම මූලික ධර්මතාවයන් විශ්ලේෂණය කිරීම හා එහි ප්‍රායෝගික භාවිතයේ න්‍යායාත්මක පැතිකඩ කෙරේ අවධානය යොමු කළෙමි. එසේම විවිධ කලා ක්ෂේත්‍රයන් අධ්‍යයනය කිරීමේදී ඒවායේ දක්නට ලැබෙන ශිල්පීය ක්‍රමවේදයන් හඳුනා ගැනීම ද කලා ශිල්පියෙකුට

හෝ කලා ඉතිහාසඥයෙකුට අතිශය වැදගත් වේ. මූලික දෘශ්‍ය කලා සංකල්ප අධ්‍යයනය කිරීම මේ නයින් අත්‍යවශ්‍ය ය. මෝස්තර හා සංරචන සැලසුම්කරණය, වර්ණ හා එහි න්‍යායාත්මක මෙන් ම ප්‍රායෝගික භාවිතයන්ගේ සිද්ධාන්තමය ක්‍රමවේදය, මෝස්තර කලාවේ ප්‍රධානතම ධර්මතාවයන් හඳුනාගැනීම ආදිය සඳහා අවශ්‍ය පසුබිම මෙයින් සකස් කෙරේ.

විශේෂයෙන් ම 'කලාව' යනු කුමක්ද ? යන්න අපි පළමුවෙන් අවධාරණය කර ගත යුතු ය. විවිධාකාර ලෙස එය කෙසේ නිර්වචනය කරන්නේ දැයි ආරම්භක ප්‍රවේශයේ සඳහන් කළෙමි. එහිදී ලෝකයේ කලාව නිර්වචනය කරන්නේ කුමන ආකාරයටද යන්න පැහැදිලි කොට තිබේ. එසේම දෘශ්‍ය කලා, ලලිත කලා, ජනකලා, ව්‍යවහාරික කලා ආදී වශයෙන් එහි පරාසයන් හා සීමාවන් හඳුන්වා දීමට උත්සාහ කළෙමි.

ලෝකයේ කලාව සඳහා භාවිත ශිල්පීන් හා තාක්ෂණික ශිල්ප ක්‍රමයන් විවිධාකාරය. ඇඳීමේ තාක්ෂණය හා ක්‍රමවේදයන් නෙළීම හා වාත්තු කිරීම ආදියත් කෙසේ විග්‍රහ කරන්නේ දැයි සහ ලෝකයේ භාවිතවන අර්ථකථන මඟින් 'කලාව' පිළිබඳ නිර්වචනය තව දුරටත් පුළුල් කොට හඳුනා ගැනීමට උත්සාහ කළෙමි. ඒ අනුව ජගත් ශිල්ප ක්‍රම හඳුනා ගැනීම මෙන් ම සාම්ප්‍රදායික තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කළෙමි.

මෙහි අත්පිටපත සකස් කිරීම ආරම්භ කරන ලද්දේ මීට වසර පහකට හයකට පමණ පෙර ය. ඉහතින් දැක්වූ සියල්ල එක්තැන් කොට එක් කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මුලදී අදහස් කළත් එය කිහිප ආකාරයකින් අසීරු කටයුත්තක් බව සිතුණි. ප්‍රමාණයට වඩා විශාල වීම, මිලදී ගැනීමේදී ප්‍රේක්ෂකයා අපහසුතාවයට පත්වීම මේ අතර ප්‍රධානය. එසේ හෙයින් මෙහි ඇති කරුණු සම්භාරය වෙන් වෙන් ම කොටස් දෙකකින් ඉදිරිපත් කරමි. ඉන් පළමු කෘතිය මෙසේ ප්‍රකාශයට සඳහා සූදානම් කළෙමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ
පුරාවිද්‍යා අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2009.05.12